# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1859/60 - 2014 අප්‍රේල් මස 25 වැනි සිකුරාදා - 2014.04.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ විල්ගමුව ප්‍රාදේශීය සභාවේ සභිකධූරයේ පුරප්පාඩුව පිරවීම**

මිය යාම හේතු කොට ගෙන විල්ගමුව ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

යාපා මුදියන්සේලාගේ සූරිය බණ්ඩාර නම් වූ සභිකයා අයත් වන එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත්, ඒ විල්ගමුව ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තේරී පත් වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු නාම යෝජනා කිරීමට, ඉහත කී, ආඥාපනතේ 65අ (2) වැනි වගන්තිය යටතේ, මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නිශ්චිත කාල පරිච්ඡේදය ඇතුළත නාමයෝජනා නොකරනු ලැබ ඇති හෙයින් ද ;

විල්ගමුව ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී සුදු දේවගේ ශානික අනුරුද්ධ රූපසිංහ වන මම, 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත. (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ (2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, 2011 ජූලි මස 23 වැනි දින විල්ගමුව ප්‍රාදේශීය සභාව සඳහා පැවැත්වූ ඡන්ද විමසීමේදී තෝරා පත්කර ගත් අවසාන සභිකයා ලඟට වැඩිම මනාප සංඛ්‍යාව ලබාගත් එම්. එම්. ඒ. ජී. රූපසිංහ බංඩාර මහතා විල්ගමුව ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

එස්. ඩී. එස්. ඒ. රූපසිංහ,
තේරීම්භාර නිලධාරී,
විල්ගමුව ප්‍රාදේශීය සභාව.

2014 අප්‍රේල් මස 10 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
මාතලේ.

05 - 310


1A - G 019467 — 75 (2014/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*